# වාර්ෂික වාර්තාව
# 2018
## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## වාර්ෂික වාර්තාව

## 2018

# පටුන


ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ දැක්ම .............................................. 05

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මෙහෙවර ...................................... 05

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථ ..................................... 06

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශ මූලධර්ම ....................................... 07

අමාත්‍යවරයාගේ පණිවිඩය ........................................................................................... 11

සභාපතිවරයාගේ පණිවිඩය ........................................................................................... 12

විධායක සාරාංශය ........................................................................................................ 15

2018 දී ජයග්‍රහණ

1. **පර්යේෂණ සහ ජාත්‍යන්තර කටයුතු ......................................................** **17**

1.1 සංචාරක ක්‍රියාකාරීත්ව පිළිබඳ දර්ශක ................................................... 17

1.2 ගුවන් තොටුපොලින් පිටව යන අය පිළිබඳ සමීක්ෂණය 2018 ................. 18

1.3 පර්යේෂණ ප්‍රකාශනය .................................................................. 18

1.4 ජාත්‍යන්තර අත්දැකීම් සහ සංවර්ධනය ............................ 19

2. **සැලසුම් කිරීම සහ ධාරිතාව ගොඩනැගීම ..........................................** **19**

2.1 සංචාරක නිකේතන සංවර්ධනය ......................................................... 19

2.1.1 කල්පිටිය සංචාරක නිකේතනය ...................................................... 19

2.1.2 කුච්චවේලි වෙරළබඩ සංචාරක නිකේතනය .................................. 20

2.1.3 දෙද්දූව ජලාශ්‍රිත නිකේතනය ..................................................... 20

2.1.4 සංචාරක නිකේතන සඳහා හඳුනාගෙන ඇති නව ස්ථාන ........................ 21

2.2 පවතින සංචාරක නිකේතන අලුත්වැඩියා කිරීම සහ තත්වයෙන් උසස් කිරීම 21

2.2.1 යාල වනජීවී සංචාරක නිකේතනය ...................................................... 21

2.3 නිවෙස් ලැගුම් වැඩසටහන ............................................................... 21

2.4 සංචාරක ලාංඡන වැඩසටහන ............................................................ 22

2.5 වැඩි ප්‍රසිද්ධියක් නොමැති සංචාරක ආකර්ෂණ ව්‍යාපෘති ............................................ 22

3. **සංචාරක අංශයේ ආයෝජන** 22

3.1 ආයෝජක සම්බන්ධතා ඒකකය ........................................................... 22

3.2 ආයෝජක සම්බන්ධතා ඒකකයේ ප්‍රගතිය ........................................................... 23

**4. ප්‍රමිතිය සහ තත්ත්ව සහතිකකරණය 25**

4.1 සංචාරක ආයතන ලියාපදිංචිය ........................................... 25

4.2 සංචාරක හෝටල් වර්ගීකරණය ....................................................... 25

4.3 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී සහ බලපත් ලබාගෙන ඇති සංචාරක මගපෙන්වන්නන් ...................................................... 26

4.4 මත්පැන් සඳහා බලපත්‍ර සහ නේවාසික වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ - 2018 26

4.4.1 මත්පැන් සඳහා වන බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ - 2018 ...... 26

4.4.2 නේවාසික වීසා සඳහා වන බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ - 2018 ......... 27

4.5 දැනුම්වත්කිරීම හා පුහුණු වැඩසටහන් සහ ජංගම සේවා 27

4.6 විශේෂ සිදුවීම් ............................................................................. 28

4.7 ශ්‍රී ලංකා සංචාරක තිලිණ - 2018 .................................................... 28

4.8 ජාතික තිරසර සංචාරක සහතිකපත් පිරිනැමීමේ වැඩපිළිවෙළ ......................... 28

**5. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය....................................... 29**

**6. දේශීය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා අංශය .............................. 30**

6.1 ටුක් ටුක් ආශ්‍රිත ප්‍රවාහන වැඩසටහන ........................................................... 30

6.2 ජීවිත ආරක්ෂක ඒකක ........................................................................... 30

6.3 සංචාරක පොලීසිය ........................................................................... 30

**7. නිවාඩු නිකේතන කළමනාකරණය ........................................................................... 30**

7.1 වෙළඳ නිවාඩු නිකේතන ........................................................................... 30

7.2 වෙළඳ නොවන නිවාඩු නිකේතන ........................................................................... 30

7.3 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් පෞද්ගලික අංශයේ පාලනය යටතේ පවතින නිවාඩු නිකේතන ....... 33

7.4 පළාත්බද සංචාරක කටයුතු ........................................................................ 33

7.5 ජගත් සංචාරක දිනය (WTD) - 2018 ................................................... 34

7.6 පළාත් සභාවල සහයෝගීත්වයෙන් විශේෂ ව්‍යාපෘති ............. 34

7.7 ප්‍රජා සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති.................................... 35

**8. මානව සම්පත් සහ ආයතන කළමනාකරණය ..................................... 36**

**9. නීති අංශය ........................................................................... 37**

**10. අභ්‍යන්තර විගණන අංශය ........................................................... 37**

**11. මූල්‍ය කළමනාකරණය 37**

**කෙටියෙදුම් ........................................................................... 37**

**12. මූල්‍ය ප්‍රකාශන 2018 ........................................................... 38-69**

**13. විගණන වාර්තාව 70-76**



# දැක්ම

"මතකයේ රැඳෙන, වඩාත්ම විශේෂිත සහ විවිධාකාර අත්දැකීම් සඳහා ලොව වඩාත්ම අනර්ඝ දූපත වශයෙන් හඳුනා ගැනීමට පාත්‍ර වීම"

සටහන් : ලෝන්ලි ප්ලැනට් (Lonely Planet) සඟරාවේ 2018 ඔක්තෝබර් කලාපය මඟින් 2019 වර්ෂයේදී සංචාරය සඳහා ලොව වඩාත්ම හොඳ රට වශයෙන් ශ්‍රී ලංකාව නම් කර ඇත. එම සඟරාව මඟින් 2013 වර්ෂයේ සංචාරය සඳහා වඩාත්ම හොඳ රට වශයෙන්ද ශ්‍රී ලංකාව නම් කර තිබුණි. ලෝන්ලි ප්ලැනට් යනු වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් පළවන සංචාරක මාර්ගෝපදේශකයකි.

# මෙහෙවර

"ස්වාභාවික සහ සංස්කෘතික උරුමය සහ පරිසර හිතකාමී සාමාජීය සම්බන්ධතා පිළිබිඹු වන අයුරින් අතිවිශිෂ්ඨ අත්දැකීම් ලබාදෙන සහ ප්‍රජාවට මෙන්ම රටට ද ආර්ථික ප්‍රතිලාභ උරුමකරන ඉහළ වටිනාකම්වලින් යුත් ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම"



# අභිමතාර්ථ

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ පිහිටුවා තිබෙන ව්‍යවස්ථාපිත ආයතනයකි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථයන් පහත සඳහන් වේ.

(අ) දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් බවට පත්කිරීම.

(ආ) සංචාරක ව්‍යාපාරයට අදාළව අමාත්‍ය මණ්ඩලය සකස් කරන ප්‍රතිපත්ති රාමුවට අනුව සංචාරක ව්‍යාපාරය සහ ඊට සම්බන්ධ කටයුතුවලට අදාළව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ඇ) දේශීය සහ ජාත්‍යන්තරව ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් සංවර්ධනය, ප්‍රවර්ධනය සහ අලෙවිකිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනය කාර්යාංශයට උපදෙස් ලබාදීම.

(ඈ) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන මානව සම්පත් පුහුණු කිරීමේ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා මඟපෙන්වීම ලබාදීම.

(ඉ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය සඳහා දක්වන දායකත්වය තවදුරටත් පවත්වා ගැනීම සඳහා සංචාරක අංශය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

(ඊ) තිරසරව නිවාඩු නිකේතන පවත්වා ගැනීම ඇතුළු ප්‍රමාණවත් ආකර්ශණීය සහ කාර්යක්ෂම සංචාරක සේවාවක් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම.

(උ) සංචාරක කර්මාන්තය සහ අනිකුත් අදාළ අංශයන් දේශීය සහ ජාත්‍යන්තරව පිළිගත් තත්ත්වයන්ට අනුකූලව පිහිටුවීම සහ පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා බලපත්‍ර ලබාදීම සහ සුපරීක්ෂාව.

(ඌ) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ එම කර්මාන්තයට අදාළ පුද්ගලයන්ගේ ප්‍රවර්ධන සහ පුහුණු කටයුතු සඳහා පෞද්ගලික අංශයේ පුද්ගලයන්ගේ සහභාගිත්වය උනන්දු කිරීම.

(එ) ඉහත සඳහන් අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන අනෙකුත් සියලුම කටයුතු ඉටුකිරීම.



# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශ මූලධර්ම

2017- 2020 කාලය දක්වා වන ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම අනුව මාර්ගෝපදේශ මූලධර්ම පහත සඳහන් පරිදි වේ.

## 01. සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට අත්පත් කර ගැනීම.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ විවිධාංගීකරණය සඳහා සංචාරක කර්මාන්තය සැලකිය යුතු ලෙස දායක වේ. සංචාරක අංශය ආර්ථිකයට ප්‍රධාන අංගයක් වශයෙන් මෙන්ම රාජ්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ප්‍රමුඛතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයක්ද වේ. රාජ්‍ය අංශයේ පහසුකම් සැලසීම යටතේ පෞද්ගලික අංශය සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ යුතුයි.

## 02. සෑම කෙනෙකුටම ආර්ථිකව දායකවීමට හැකිවීම.

විදේශ විනිමය ඉපයීම, ඉහළ නැංවීම, සංවර්ධනය දිවයින පුරා ව්‍යාප්ත කිරීම සහ ශ්‍රී ලාංකිකයන්ට ඵලදායි රැකියා අවස්ථා ඇති කිරීම මඟින් සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රශස්ත මට්ටමින් දායක විය යුතුය. තවද සියලුම පාර්ශවකරුවන්ට සමාජ ආර්ථික ප්‍රතිලාභ සමසේ බෙදී යන අයුරින් සංචාරක අංශයේ වර්ධනය, වටිනාකම්දාමය උද්දීපනය සහ ශක්තිමත් කිරීම සහ ඵලදායි දීර්ඝකාලීන ආර්ථික ක්‍රියාමාර්ග ඇති කිරීම තහවුරු කළ යුතුය.

## 03. වත්කම් සංරක්ෂණය සහ ජාත්‍යන්තර මට්ටමේ කළමනාකරණය.

සිදුවිය හැකි හානිකර බලපෑම් මගහරවා ගනිමින්, සංචාරක ක්ෂේත්‍රය හැමවිටම ස්වාභාවික පරිසරය සහ එහි ඓතිහාසික, සාමාජීය සහ සංස්කෘතික දයාදයන් වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය. තවද, අත්‍යවශ්‍ය පාරිසරික ක්‍රියාවලි පවත්වා ගනිමින් සහ ස්වාභාවික ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරමින් ස්වාභාවික සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීමට සංචාරක කර්මාන්තය කටයුතු කළ යුතුය.

## 04. දේශීය ප්‍රජාවේ සහභාගිත්වය

සංචාරක කර්මාන්තය සත්කාරක ප්‍රජාවේ සමාජ සංස්කෘතික අනන්‍යතාවයට ගරු කළ යුතු වන අතර ඔවුන් ගොඩනගන ලද සහ ජීවමානව පවත්වාගෙන යන සංස්කෘතික උරුමයන් සහ පාරම්පරික වටිනාකම් සංරක්ෂණය කළ යුතුය. තවද ඔවුන්ගේ අන්තර් සංස්කෘතික අවබෝධය සහ දරාගැනීමේ හැකියාව තවදුරටත් පෝෂණය කළ යුතුය. සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රාදේශීය ජන සමාජය යතාර්ථවාදී සහ පුළුල් පරාසයකින් සම්බන්ධකර ගත යුතුය. කලාපීය සහ ප්‍රාදේශීය දේශපාලන සහභාගිත්වය සහිත ප්‍රබල දේශපාලන නායකත්වයෙන් අදාළ පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගිත්වය ලබාගැනීම දිරිගැන්වීමත් එකගතා ඇතිකර ගැනීමට සහය දීමත් සිදු කළ යුතුය.

## 05. උරුමය තුළ මුල් බැස ඇති අමතක නොවන අත්දැකීම්

සියලුම සංචාරක සේවා සහ ක්‍රියාකාරකම් සංචාරකයා පාදක කරමින් සිදු කළ යුතු අතර ඒවා ශ්‍රී ලංකාවේ පාරිසරික, ආගමික, සමාජීය සහ සංස්කෘතික උරුමය තුළ මුල් බැස තිබිය යුතුය. සංචාරක සේවා සහ ක්‍රියාකාරකම් මගින් සංචාරකයාට ඉහළ තෘප්තියක් සැපයිය යුතු අතර සංචාරකයාට ඉගෙන ගැනීමේ අවස්ථාවන් ලබාදෙමින් සහ යහපත් සංචාරක කටයුතු පිළිබඳ අවබෝධය ඇති කිරීමට කටයුතු කරමින් සංචාරකයාට අර්ථවත් අත්දැකීම් ලබා ගැනීම තහවුරු කළ යුතුය.

## 06. වගකිව යුතු ගමනාන්ත අලෙවිකරණය

ශ්‍රී ලංකාවේ සුවිශේෂ පරිසරය, සම්ප්‍රදායන් සහ ආකර්ෂණීය ස්ථාන ඉස්මතු කිරීමට ශ්‍රී ලංකාව වගකීමෙන් යුතුව අලෙවි කල යුතුය. තවද ශ්‍රී ලංකාව සහ සංචාරක කර්මාන්තය පිළිබඳ දිගු කලක සිට පවතින දුර්මතයන් පහ කිරීමට ද කටයුතු කළ යුතුය.

## 07. සියලු දෙනාට (සුරක්ෂිත බව සහ ආරක්ෂාව)

සියලුම සංචාරකයන්, ආයෝජකයන් සහ ප්‍රජාව මෙන්ම සතුන් සඳහාද ආරක්ෂාව සහ සුරක්ෂිත වටපිටාව තහවුරු කළ යුතුය.

# සංස්ථාපිත තොරතුරු

සංචාරක අංශයේ ප්‍රමුඛ ආර්ථික සංවර්ධන කාර්යාංශයක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ වැදගත් සේවා අංශයකි. එය විශිෂ්ඨත්වය නවීකරණය සහ සහයෝගිතාවයන් සඳහා ඉතාමත් ප්‍රසිද්ධය. සංවර්ධන අධිකාරිය සංචාරක ක්ෂේත්‍රයේ උන්නතිය මෙහෙයවන අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රධාන මෙහෙයුම්කරුවෙකි.

**නාමය**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**නීතිමය ස්වරූපය**

2005 වර්ෂයේ අංක 38 දරන පනත යටතේ පිහිටවූ ව්‍යවස්ථාපිත සංස්ථාවකි.

**ප්‍රධාන කාර්යාලයේ ලිපිනය**

නො: 80, ගාලු පාර, කොළඹ 03.

**ජාතික නිවාඩු නිකේතන පිහිටි ස්ථාන**

පාසිකුඩා, කුච්චවේලි, කල්පිටිය, බෙන්තොට, ගිරිතලේ, පොළොන්නරුව සහ යාල.

**නේවාසික නිවාඩු නිකේතන පිහිටි ස්ථාන**

අනුරාධපුර, බණ්ඩාරවෙල, බෙන්තොට, කතරගම සහ නුවරඑළිය.

**විගණනය**

ශ්‍රී ලංකාවේ විගණකාධිපති.

**බැංකුකරු**

ලංකා බැංකුව.

# කළමනාකරණ මණ්ඩලය

1. කාවන් රත්නායක මහතා - සභාපති
2. උපාලි රත්නායක මහතා - සාමාජික
3. ඇසල වීරකෝන් මහතා - සාමාජික
4. එච්. ටී. කමල් පද්මසිරි මහතා - සාමාජික
5. පී. අල්ගම මහතා - සාමාජික
6. නිශාන්ත සෙනවිරත්න මහතා - සාමාජික
7. රුවන් කරුණාරත්න මහතා - සාමාජික
8. එම්. ශාන්තිකුමාර් මහතා - සාමාජික

## විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

1. නිශාන්ත සෙනෙවිරත්න මහතා
2. රුවන් කරුණාරත්න මහතා
3. එම්. ශාන්තිකුමාර් මහතා
4. පී. අල්ගම මහතා
5. කාවන් රත්නායක මහතා
6. සුනන්දා පියසීලි මහත්මිය
7. එස්. සංජීව මහතා

## හෝටල් වර්ගීකරණ කමිටුවේ සාමාජිකයන්

1. ගැමුණු ගුණවර්ධන මහතා - සභාපති
2. ටී. කේ. වර්ණසූරිය මහතා - සාමාජික
3. ඉරාජ් අබේවර්ධන මහතා - සාමාජික
4. ඩෙස්මන්ඩ් ප්‍රනාන්දු මහතා - සාමාජික
5. විජිත පෙරේරා මහතා - සාමාජික
6. හිරාන් සේරසිංහ මහතා - සාමාජික
7. අමල් නානායක්කාර මහතා - සාමාජික

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

| අංශය | තනතුර | නම |
|---|---|---|
| අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය | අධ්‍යක්ෂ ජෙනරාල් | උපාලි රත්නායක මහතා |
| මානව සම්පත් සහ ආයතන කළමනාකරණය | අධ්‍යක්ෂ | තරංගා රූපසිංහ මහත්මිය |
| දේශීය සංචාරක සහ ප්‍රජා සම්බන්ධතා | අධ්‍යක්ෂ | මිහිර ලියනාරච්චි මහතා |
| නිකේතන කළමනාකරණය | අධ්‍යක්ෂ | සිසිර වීරසේකර මහතා |
| ගුණාත්මකභාවය සහ තත්ත්ව සහතික කිරීම | අධ්‍යක්ෂ | චන්දන විජේරත්න මහතා |
| මූල්‍ය කළමනාකරණය | අධ්‍යක්ෂ | සම්පත් ගනේපල ආරච්චි මහතා |
| සංචාරක සැලසුම් සහ සංවර්ධන | අධ්‍යක්ෂ (වැඩ බලන) | භාග්‍යා එන්. මහවිතානගේ මහත්මිය |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | අධ්‍යක්ෂ | උදාන වික්‍රමසිංහ මහතා |
| අභ්‍යන්තර විගණන | අභ්‍යන්තර විගණක | කේ.එම්. නහීම් මහත්මිය |
| නෛතික | නීති නිලධාරි | ඉනෝකා පුංචිහේවා මහත්මිය |


Jaffna
Trincomalee
Anuradhapura
Kalpitiya
Sigiriya
Polonnaruwa
Dambulla
Arugambay
Negombo
Kandy
Pinnawala
Nuwara Eliya
Katunayaka
Colombo
ELLA
Ella
Yala
Bentota
Sri Padha
Galle
Mirissa

# සංචාරක ප්‍රවර්ධන, වනජීවි සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ පණිවිඩය, ගරු ජෝන් අමරතුංග මහතා



සංචාරක විෂයභාර කැබිනට් අමාත්‍යවරයා වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2018 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය නිකුත් කිරීමට හැකිවීම පිළිබඳ මම ඉතාමත් සතුටුවෙමි.සංචාරක කර්මාන්තයට විවිධ අංශවලින් සෘජුව බලපාන අභියෝග රාශියක් මෙම වාර්ෂික සමාලෝචනයෙන් පෙන්වාදෙයි. දේශගුණික සාධක හැර මහනුවර පෙරහැර සමයට පෙර ඇතිවූ මහජන නොසන්සුන්තාවයක් සහ වර්ෂය අවසාන භාගයේ ඇතිවූ දේශපාලන අසමඟිය සංචාරකයින් පැමිණීමට මෙන්ම සමස්ථ සංචාරක ක්ෂේත්‍රයටම සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදි. සංචාරක කර්මාන්තය ඉතාම සංවේදී ක්ෂේත්‍රයක් බවත් එහි සාර්ථකත්වය රටක දිගු කාලීන ස්ථාවරභාවය මත රඳා පවතින බවත් සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

කෙසේවුවත්, මෙම සියලු බාධාවන් මධ්‍යයේ වුවද, 2018 වර්ෂයේදී වාර්තාගත අයුරින් සංචාරකයන් දශ ලක්ෂ 2.33 ක පැමිණීමත්, පෙර වර්ෂයට සාපේක්ෂව 10% වර්ධනයක් ලඟා කර ගැනීමත් සතුටින් සඳහන් කරමි. ආසන්න වශයෙන් වර්ෂයෙන් තුනෙන් එකකට සමාන කාලසීමාවක් රට අස්ථාවර තත්ත්වයට පත් කළ ඉහත සදහන් ගැටලු නොතිබෙන්නට සංචරකයන් මිලියන 2.5 ක මුල් ඉලක්කය ඉතා පහසුවෙන් සාක්ෂාත් කර ගත හැකිව තිබුන බව මම විශ්වසයෙන් සදහන් කරමි. මෙම සිදුවීම් මගෙ අමාත්‍යංශ පලනයෙන් සම්පුර්ණයෙන් තොර බව අවධාරණය කිරීම අවශ්‍යය වේ. එසේ වුවද වර්ෂය තුළ සංචාරක අංශයේ ආදායම 20% කින් වැඩිවී මෙතෙක් වාර්තා වූ වැඩිම ආදායම වන රුපියල් බිලියන 712 විය. සංචාරක අංශයේ සෘජු රැකියා නියුක්තියද 30,000 න් වැඩි වී මුළු ශ්‍රම බලකාය 390,000 ක් බවට මේ වනවිට පත්වී ඇත. ආධාරක සේවා කාර්ය මණ්ඩලය සමඟ ගතහොත් මෙම සංඛ්‍යාව තවත් ඉහළ අගයක් ගනී.

නිශේධක සිදුවීම් යටතේ වුවත් පීඩාකාරී බලපෑම් පාලනය කරගැනීමට රජයේ සහයෝගාත්මක උත්සාහය පිළිබඳ ආයෝජකයන් විශ්වාසයෙන් සිටීම පිළිබඳ ව සඳහන් කිරීම වැදගත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයේ ක්‍රියාත්මක කරන සංචාරක ව්‍යාපෘති 350 ට නොඅඩු සංඛ්‍යාවකට අවසන් අනුමැතිය ලබාදී ඇත.එහි ප්‍රතිඵලයක් වශයෙන් නව කාමර 18,500 ට වැඩි සංඛ්‍යාවක් නුදුරු අනාගතයේදීම සංචාරක අංශයට එකතු වනු ඇත. ඒ අනුව දිවයිනේ දැනට පවතින සංචාරක කාමර සංඛ්‍යාව 35,000 සිට 50,000 ට වැඩි සංඛ්‍යාවක් දක්වා වැඩි වනු ඇත. සමාලොචිත වර්ෂය තුළදී නව කාමර 3500 ක් සංචාරක කර්මාන්තයට එකතු වී ඇත.

සංචාරක කර්මාන්තය පුළුල් කිරීම අනුව මාගේ අමාත්‍යාංශය නව සංචාරක නිකේතන ප්‍රදේශ සංවර්ධනය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ දැනටමත් පවතින සංචාරක නිකේතන වැඩිදියුණු කිරීම සඳහා අවධානය යොමුකර ඇත. කුච්චවේලි, කල්පිටිය සහ දෙද්දූව දැනටමත් නව නිකේතන වශයෙන් සංවර්ධනය කරන අතර බෙන්තොට සහ යාල මෑතකදී වැඩි දියුණු කළ සංචාරක නිකේතනයන්ය.තවද නුවරඑළිය, අනුරාධපුර සහ කතරගම පිහිටි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් සංචාරක පහසුකම් සම්පූර්ණයෙන්ම නැවත වැඩි දියුණු කර ඇත.

සංචාරක කර්මාන්තයේ නව වර්ධනයත් සමඟ තිරසර පැවැත්ම වෙන කවරදාටත් වඩා වර්තමානයේ දී වැදගත් බව මම දනිමි. එබැවින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමාලෝචිත වර්ෂය තුළදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළට අයත් ජෛව විවිධත්ව මූල්‍ය මුලපිරීම් වැඩසටහන යටතේ ජාතික තිරසර සංචාරක සහතික කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. තවද සංචාරක කර්මාන්තයට සෘජුව සහ වක්‍රව සම්බන්ධ වන පුද්ගලයන්ට යෝග්‍ය පුහුණුවීම් ලබාදීමෙන් සංචාරක කර්මාන්තය තිරසරව පවත්වා ගත හැකි බව මම විශ්වාස කරමි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සංචාරක කටයුතුවල නියලෙන්නන්ට ජල ක්‍රීඩා, අවදානම් සහිත සංචාරක කටයුතු, නැරඹුම් වාහන රියදුරන්, ටුක් ටුක් රියදුරන්, නිවාස පහසුකම් සපයන්නන් සහ සංචාරක මග පෙන්වන්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ඇරඹීය.

තවද පළාත් සංචාරක ආයතනවල කාර්ය මණ්ඩලය විවිධ අංශයන් යටතේ පුහුනු කරන ලද අතර නව සංචාරක ප්‍රදේශ හදුනා ගැනීම සඳහා පළාත් සභා යටතේ වැඩසටහනක් දියත් කරන ලදි. විශේෂයෙන්ම මෑතක වාර්තාවූ සිදුවීම් කිහිපයක් සමඟ, සංචාරකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ප්‍රධාන සංචාරක ප්‍රදේශ ආවරණය වන අයුරින් නව සංචාරක පොලිස් මුරපොළ (Police posts) 25ක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

අවිධිමත් ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය හැකිතාක් දුරට ක්‍රමවත්ව සිදුවීම කෙරෙහි මා උනන්දු වන අතර මේ වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ප්‍රධාන සංචාරක ප්‍රදේශ ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කෙරේ.

මේ සියලුම ක්‍රියාකාරකම් මගින් අපගේ දේශීය සංචාරක ක්ෂේත්‍රයේ සියලු අංශවල ශක්තිමත් වර්ධනය පෙන්නුම් කරන අතර ඉදිරියේ ක්ෂේත්‍රයේ සිදුවන පුළුල් වීම් සඳහා අවශ්‍ය වන පසුබිම දැනටමත් සකසා තිබීම පිළිබඳව මම සතුටු වෙමි. මගේ කණ්ඩායමේ සහයෝගය නොවන්නට මේ කිසිවක් සිදු නොවන්නට තිබුණි. සභාපති, අධ්‍යක්ෂ ජෙනරාල්, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සියලුම කාර්ය මණ්ඩලය වෙත ඔවුන් දැක්වූ සහයෝගය සහ ඒ සඳහා කළ කැපකිරීම වෙනුවෙන් මාගේ ස්තූතිය පුදකරමි. ඉදිරි වර්ෂය සඳහා සකස් කරන ලද ඉලක්ක සපුරා ගැනීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට කිසිසේත් අපහසු නොවනු ඇතැයි මාගේ බලවත් විශ්වාසය වන අතර ආයතනයේ සාර්ථකත්වය ප්‍රාර්ථනා කරමි.

**ජෝන් අමරතුංග**
**සංචාරක ප්‍රවර්ධන, වනජීවි සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය**

## සභාපතිවරයාගේ පණිවිඩය,
## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
## ජොහාන් ජයරත්න මහතා



වර්ෂ හතරක් සඳහා වූ අපගේ සංචාරක උපායමාර්ගික සැලැස්මේ දෙවන වර්ෂය වන 2018 වර්ෂය සම්පූර්ණ කිරීමේදී,සංචාරක අංශයේ ශක්තිමත් වර්ධනය දැකීමට හැකිවීම පිළිබඳ සතුටු වෙමි. මූලික වශයෙන්,මෙම සලැස්මේ අභිමතාර්ථ වන්නේ ජාතික ආදායම ඉහළ නැංවීම, ප්‍රාදේශීය ප්‍රජාවන්ට අතදීම සහ තිරසර පදනමින් සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම වේ.

විදේශ රැකියා ආදායම සහ රෙදිපිළි සහ නිමි ඇඳුම් ඉපයීම හැරුනු විට සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම අපනයන ආදායම් මාර්ගය වේ. 2018 වර්ෂය තුළ සංචාරක කර්මාන්තය ඇමරිකානු ඩොලර් බිලියන 4.3 ක ආදායමක් උපයා ඇති අතර එය දළ දේශිය නිෂ්පාදිතයට 4.9% ක සෘජු දායකත්වයක් දක්වයි. 2018 වර්ෂය තුළ සංචාරකයන්ගේ පැමිණීම 2,333,796 වූ අතර එම ප්‍රමාණය කලින් වර්ෂයට වඩා 10.3% ක වර්ධනයකි. දිනකට සංචාරකයෙකුගෙන් ලැබෙන විදේශ විනිමය ඇමරිකානු ඩොලර් 173.8 කි. තවද 2018 වර්ෂය තුළ සංචාරක ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය 388,487 වූ බවද ආඩම්බරයෙන් සඳහන් කරමු.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාළ කටයුතු වලදී 2018 වර්ෂය ශක්තිමත් කාර්ය සාධනයන් සහිත විශිෂ්ට කාලපරිච්ඡේදයකි. සියලුම අංශවල ඉහළ වර්ධනයක් සඳහා සැලකිය යුතු ඉඩ ප්‍රස්ථාවන් තිබෙන අතර සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධියට දායක විය හැකි නව ව්‍යාපෘති සහ නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීම ඉදිරියේදීත් ප්‍රමුඛත්වයෙහිලා කටයුතු කෙරනු ලැබේ.

සංචාරක කර්මාන්තය එහි ඉහළම තලය දක්වා ගෙන ඒමට ඔවුන්ගේ උපරිම දායකත්වය නොකඩවා ලබා දීමට කටයුතු කරන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාවය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**ජොහාන් ජයරත්න**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට :

පළමු පේළිය : කමල් පද්මසිරි මහතා (සාමාජික), එම්. ශාන්තිකුමාර් මහතා (සාමාජික), කාවන් රත්නායක මහතා (සභාපති), ඇසළ වීරකෝන් මහතා (සාමාජික), ඉනෝකා පුංචිහේවා මහත්මිය (ලේකම්)

දෙවන පේළිය: පී. අල්ගම මහතා (සාමාජික), පී. යූ. රත්නායක මහතා (සාමාජික), රුවන් කරුණාරත්න මහතා (සාමාජික), තිලක් වීරසිංහ මහතා (සාමාජික), නිශාන්ත සෙනෙවිරත්න මහතා (සාමාජික)

# අධ්‍යක්ෂවරුන් සහ ප්‍රාදේශීය ප්‍රධානීන්



ජොහාන් ජයරත්න මහතා
සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



උපාලි රත්නායක මහතා
අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය



මිහිර ලියනාරච්චි මහතා
දේශීය සංචාරක සහ ප්‍රජා සම්බන්ධතා



චන්දන විජරත්න මහතා
ගුණාත්මකභාවය සහ තත්ත්ව සහතික කිරීම



සිසිර වීරසේකර මහතා
නිකේතන කළමනාකරණය



උදාන වික්‍රමසිංහ මහතා
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය



තරංගා රූපසිංහ මහත්මිය
මානව සම්පත් සහ ආයතන කළමනාකරණය



සම්පත් ගනේපලආරච්චි මහතා
මූල්‍ය කළමනාකරණය



භාග්‍යා මහවිතානගේ මහත්මිය
සංචාරක සැලසුම් සහ සංවර්ධන



ඉනෝකා පුංචිහේවා මහත්මිය
නීති නිලධාරි



කේ. එම්. නහීම් මිය
අභ්‍යන්තර විගණන

## විධායක සාරාංශය

2018 වර්ෂය තුළදී සංචාරක අංශය මනා කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදි.

- 2017 වර්ෂය තුළදී රුපියල් බිලියන 598 ක් වූ විදේශ විනිමය ඉපයීම 2018 වර්ෂයේදී රුපියල් බිලියන 712 දක්වා ඉහළ ගිය අතර එය පෙර වර්ෂයට වඩා රුපියල් බිලියන 114 ක එනම් 19% ක වර්ධනයකි.
- 2017 වර්ෂය තුළදී මෙරටට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව වන බිලියන 2.12, 2018 වර්ෂය තුළදී බිලියන 2.33 දක්වා දළ වශයෙන් ලක්ෂ 2 කින් එනම් 10.3% ක වර්ධනයක් විය.
- 2017 වර්ෂය තුළදී 359,000 ක් වූ ඍජු සහ වක්‍ර රැකියා අවස්ථා සංඛ්‍යාව 2018 වර්ෂය තුළදී 388,000 ක් දක්වා 29000 කින් එනම් 8.1% කින් වර්ධනය විය.
- 2018 වර්ෂය තුළදී සංචාරක කාමර සංඛ්‍යාව 3,341 කින් වැඩි වී මුළු සංචාරක කාමර සංඛ්‍යාව 35,397 දක්වා ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සංචාරකයන් ඇතුළු සංචාරක අංශයේ පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාසික සංචාරකයන් පැමිණීම් වාර්තාව, ත්‍රෛමාසික ව්‍යාපාර වාර්තාව, සංචාරක අංශ වාර්තාව, වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තාව සහ සංචාරය අවසන් කර ආපසු යන සංචාරකයන් පිළිබඳ සිදුකරන වාර්තාව පළකරයි. මෙම වාර්තා ඔවුන්ගේ ව්‍යාපෘති සහ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගනී.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයට නාමපුවරු සවිකිරීමේ වැඩසටහනක් ආරම්භ කළ අතර එහි මුල් පියවරේදීම මධ්‍යම පළාත තුළ එවැනි නාමපුවරු 15ක් සවිකරන ලදි. කුලියාපිටිය, කුච්චවේලි සහ දෙද්දූව යන ස්ථානවල නව සංචාරක නිකේතන පිහිටුවා ඇත. යාල සහ බෙන්තොට පිහිටි සංචාරක නිකේතන අලුත්වැඩියා කර තත්ත්වයෙන් උසස් කර ඇත. බෙන්තොට, හික්කඩුව සහ මිරිස්ස ප්‍රදේශවල පිහිටි ජීවිතාරක්ෂක ඒකක ඉහළ මට්ටමකට වැඩිදියුණු කර ඇත. සංචාරකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සංචාරක පොලිස් බලප්‍රදේශ 25 ක් පිහිටුවීමටද සැලසුම් කර තිබේ.

සංචාරක අංශයේ ආයෝජනයන් පිළිබඳ අධ්‍යයනයක් දැනට සිදු කෙරෙමින් තිබේ. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආයෝජන වැඩිකිරීම සඳහා සහයෝගය දැක්වීමේ ව්‍යාපෘතිය වශයෙන් හැඳින්වෙන අතර එය එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වේ. 2018 වර්ෂයේදී කාමර 18,760 ක් පහසුකම් සහිත පෞද්ගලික ආයෝජකයන් යටතේ ව්‍යාපෘති 350 ක් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අවසාන අනුමැතිය ලබා දී ඇත.සංචාරක සේවා සපයන්නන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දැනටමත් ක්‍රියාත්මක වැඩසටහන්වලට අමතරව නව සේවාවන් ගණනාවක් පිළිබඳ අවධානය යොමුකර තිබේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ජෛව විවිධත්ව මූල්‍ය ක්‍රියාකාරී වැඩසටහන සමග එක්ව ජාතික තිරසර සංචාරක සහතික කිරීමේ ක්‍රමවේදය ආරම්භ කර තිබේ. ගෝලීය සහතිකකරණයට අදාළ ජලාශ්‍රිත ත්‍රාසජනක සංචාරක වැඩසටහන් පිළිබඳ දැනුම්වත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන, ත්‍රාසජනක සංචාරක සේවා සපයන්නන් සඳහා ශ්‍රී ලංකා තත්ව පාලන ආයතනයේ (SLS) සහයෝගයෙන් ලංකා ස්පෝර්ට් රේසන් (LSR) මගින් පාසිකුඩාහිදී පවත්වන ලදී. සෆාරි රියදුරන් සඳහා පුහුණු වැඩසටහන මින්නේරියේදී පවත්වන ලදී. සංචාරක ක්ෂේත්‍රයේ විශිෂ්ඨ සේවාවන් හඳුනාගැනීමට සහ ඇගයීම සඳහා සංචාරක ඇගයීමේ උත්සවය පවත්වන ලදී.

කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය සංවර්ධනය වෙනුවෙන් නිවාස ආශ්‍රිත ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මාර්ගෝපදේශක සකස් කර ඇත. නිවෙස් ආශ්‍රිත පහසුකම් සපයන්නන් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පුහුණු වැඩසටහන් පවත්වා ඇත. තවද, ත්‍රීවීලර් (ටුක් ටුක්) රියදුරන් පුහුණුව සඳහා ද පුහුණු වැඩසටහන් දියත් කර ඇත. 2018 වර්ෂයේදී සංචාරක මග පෙන්වන්නන් 66 දෙනෙකු සඳහා බලපත්‍ර නිකුත් කර ඇති අතර එම වර්ෂය අවසාන වනවිට මග පෙන්වන්නන් 18,760 ක් සංචාරක ක්ෂේත්‍රයට අනුයුක්තව සේවයේ යෙදුනි. පළාත් ආශ්‍රිත සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඒ ඒ ප්‍රදේශවල වැඩි ප්‍රසිද්ධියක් නොමැති සංචාරක ආකර්ෂණය ලබාගත හැකි ස්ථාන පිළිබඳ තොරතුරු මධ්‍යම තොරතුරු සංචිතයට යොමුකිරීම සහ මධ්‍යම තොරතුරු සංචිතයේ වැදගත් තොරතුරු භාවිතා කිරීම පිළිබඳව පළාත් සභා කාර්ය මණ්ඩලය පුහුණු කර ඇත.

2018 ජගත් සංචාරක දින උත්සවය යාපනයේදී පවත්වන ලදී. කජුගම - කොළඹ මහනුවර මාර්ගය දෙපස ආකර්ෂණීය වෙළෙඳ කරත්ත සහ දැන්වීම් පුවරු පිහිටුවීම, තලෙ මන්නාරම නව වෙරළ සංවර්ධනය, අම්පිටිගල සංචාරක පාරිසරික ගම්මානය සංවර්ධනය, සීතාඑළිය, සඳතැන්න කෘෂි සංචාරක උද්‍යානය, අනුරාධපුරයේ රුවන්වැලි මහා සෑය ප්‍රදේශයේ සනීපාරක්ෂ කටයුතු සංවර්ධනය, දුන්හිඳ ඇල්ල යටිතල පහසුකම් සංවර්ධනය, රාවණා ඇල්ල සංවර්ධනය, අරුගම්බේ කොට්ටුකල් මාර්ගය (කි.මී.4) පුළුල් කර සංවර්ධනය කිරීම සහ තිස්සමහාරාමය අලුත්නුවර, ගැටබරුව සහ මදුරන්කුලිය යන ස්ථානවල විවේක මධ්‍යස්ථාන පිහිටුවීම වැනි විවිධ සංවර්ධන කටයුතු ඒ ඒ පළාත්වල සිදු කර ඇත.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ඉහළ මට්ටමින් යොදාගෙන තිබේ. පාලන මණ්ඩල කටයුතු ස්වයංක්‍රීය කිරීම, විදේශ ආයෝජන ප්‍රවර්ධන සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සේවාවන් ප්‍රචලිත කිරීම සඳහා ඩිජිටල් අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කළමනාකරණය සඳහා ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග හඳුන්වා දීම, ගෙවීම් කටයුතු සඳහා පරිගණක ආශ්‍රිත ක්‍රමවේදය හඳුන්වා දීම, විද්‍යුත් පණිවුඩ සේවාව පුළුල් වශයෙන් යොදාගැනීම තොරතුරු සහ සේවාවන් ලබාදීම සඳහා දුරකතන ආශ්‍රිත මෘදුකාංග හඳුන්වාදීම සහ වර්තමාන මූල්‍ය පාලන ක්‍රමවේද වෙනුවට මෘදුකාංග ආශ්‍රිත පද්ධති කළමනාකරණ ක්‍රියාවලි හඳුන්වාදීම සඳහා ක්‍රමවේදයන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දීම යටතේ ක්‍රියාත්මක කර තිබේ.

කතරගම, අනුරාධපුරය සහ නුවරඑළිය ප්‍රදේශවල පැවති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ගෘහාශ්‍රිත සංචාරක නවාතැන් මධ්‍යස්ථාන 2018 වර්ෂයේදී නවීකරණය කර වැඩිදියුණු කරන ලදී.

වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන සහ කැළණිය පෙරහැර, ගංගාරාම පෙරහැර, බෙන්තොට ඇලපාත විහාර පෙරහැර, බෙල්ලන්විල පෙරහැර සහ කෝට්ටේ රජ මහා විහාර පෙරහැර වැනි ප්‍රජා සම්බන්ධතා වැඩ සටහන් ගණනාවක්ම ක්‍රියාත්මක කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයේදී සංචාරකයන් ගුවන්ගත වීමේ බද්ද වශයෙන් රු. මිලියන 2,824.97 ක් ද සංචාරක අංශයේ සංවර්ධන බද්ද වශයෙන් රු. මිලියන 1,482.08 සහ අනිකුත් ආදායම් වශයෙන් රු.මිලියන 11.08 උපයා ඇත. මුළු ආදායම වන රු. මිලියන 4,318.13 ක ප්‍රමාණය, 14% ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියටත්, 70% ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයටත්, 12% ක් ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයටත්, 4% ක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයටත් වශයෙන් ලබා දී තිබේ.

# 1. පර්යේෂණ සහ ජාත්‍යන්තර කටයුතු

## 1.1 සංචාරක කාර්ය සාධන දර්ශක

ජාත්‍යන්තර සංචාරකයන්ගේ පැමිණිම, දළ විදේශ විනිමය ඉපයීම සහ මුළු සෘජු සහ වක්‍ර රැකියා නියුක්තිය 2014- 2018 කාල පරිච්ඡේදය තුළ නොකඩවා වර්ධනය විය. පහත සඳහන් වගුව 2014 - 2018 කාල පරිච්ඡේදය තුළ සංචාරක අංශයේ දායකත්වය පෙන්නුම් කරයි.

වගුව 1.1 - 2014 - 2018 කාල පරිච්ඡේදය තුළ සංචාරක කාර්ය සාධන දර්ශක

| දර්ශකය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| සංචාරකයන්ගේ පැමිණීම | 1,527,153 | 1,798,380 | 2,050,832 | 2,116,407 | 2,333,796 |
| දළ සංචාරක ඉපයීම (රු. මි) | 317,502 | 405,492 | 512,594 | 598,356 | 712,027 |
| මුළු රැකියා උත්පාදනය | 299,890 | 319,436 | 335,659 | 359,215 | 388,487 |

ප්‍රස්තාරය 1.1 - 2014 සිට 2018 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරකයන්ගේ පැමිණීම.




2018 එක් එක් මාසය තුළ සංචාරක පැමිණීම ඊට පෙර වර්ෂයේ අදාළ මාසයට වඩා වැඩිය.

ප්‍රස්තාරය 1.2 : ඒ ඒ මාසයන්ගේ වල සංචාරක පැමිණීම 2017 සහ 2018




සංචාරක කර්මාන්තයට අදාළ ප්‍රධාන වෙළඳපොළ ප්‍රභව දහය විශ්ලේෂණයට අනුව 2018 වර්ෂයේදී ඉන්දියාව ප්‍රධාන සංචාරකයින් පැමිණෙන රට වශයෙන් තවදුරටත් රැඳී සිටින අතර එම සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීමෙන් 18.2%.චීනය දෙවන වැඩිම සංචාරකයින් පැමිණි රට වන අතර එම සංඛ්‍යාව මුළු පැමිණීමෙන් 11.4% කි. එක්සත් රාජධානිය තෙවන ප්‍රධාන සංචාරකයින් පැමිණෙන රට වන අතර ජර්මනිය සහ ඕස්ට්‍රේලියාව 2018 වර්ෂයේදී

4 වන සහ 5 වන ප්‍රධාන සංචාරකයන් පැමිණෙන රටවල් වශයෙන් රැඳී සිටී. ප්‍රධාන සංචාරකයන් පැමිණෙන රටවල වාර්ෂික දත්ත විශ්ලේෂණයට අනුව 2017/18 වර්ෂවල වැඩිම ප්‍රතිශත වෙනස වාර්තාවන්නේ පිළිවෙලින් ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය යන රටවලින් වේ. තවද 2018 වර්ෂයේදී මුළු සංචාරක පැමිණීමෙන් 68.2% ක් පැමිණ ඇත්තේ ශ්‍රී ලංකාවට සංචාරකන් වැඩිපුරම පැමිණෙන ප්‍රධාන රටවල් 10 යෙනි.

## 1.2 ගුවන් තොටුපොළින් පිටව යන පුද්ගලයන් පිළිබඳ සමීක්ෂණය - 2018

| රට | සංචාරක පැමිණීම | | වර්ධන ප්‍රතිශතය % | 2018 වර්ෂය තුළ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2017 | 2018 | | |
| ඉන්දියාව | 384,628 | 424,887 | 10.5 | 18.2 |
| චීනය | 268,952 | 265,965 | (1.1) | 11.4 |
| එක්සත් රාජධානිය | 201,879 | 254,176 | 25.9 | 10.9 |
| ජර්මනිය | 130,227 | 156,888 | 20.5 | 6.7 |
| ඕස්ට්‍රේලියාව | 81,281 | 110,928 | 36.5 | 4.8 |
| ප්‍රංශය | 97,282 | 106,449 | 9.4 | 4.6 |
| මාලදිවයින | 79,371 | 76,108 | (4.1) | 3.3 |
| එක්සත් ජනපදය | 57,479 | 75,308 | 31.0 | 3.2 |
| රුසියාව | 59,191 | 64,497 | 9.0 | 2.8 |
| නෙදර්ලන්තය | 51,148 | 57,160 | 11.8 | 2.4 |
| උප එකතුව | 1,411,438 | 1,592,366 | 12.8 | 68.2 |
| අනිකුත් රටවල් | 704,969 | 741,430 | 5.2 | 31.8 |
| මුළු එකතුව | 2,116,407 | 2,333,796 | 10.3 | 100.0 |

සංචාරකයන්ගේ පෞද්ගලික පසුබිම් තොරතුරු, සංචාරක හැසිරීම් රටා, ඔවුන්ගේ අදහස් උදහස් සහ වියදම් කිරීමේ රටා පිළිබඳ සංචාරයෙන් පසු කටුනායක ගුවන් තොටින් බැහැරව යන සංචාරකයන්ගෙන් තොරතුරු ලබා ගැනීමට කරනු ලබන සමීක්ෂණය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිත්‍ය ව්‍යාපෘති වලින් එකකි. අදාළ සමීක්ෂණය බැහැරව යන සංචාරකයන් 5034 ගේ සහභාගිත්වයෙන් 2018 පෙබරවාරි - දෙසැම්බර් කාලය තුළදී පවත්වන ලදී.





## 1.3 පර්යේෂණ ප්‍රකාශන

පර්යේෂණ සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය මගින් සංචාරක අංශයට අදාළ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු ආශ්‍රයෙන් සවිස්තර පර්යේෂණ ප්‍රකාශනය නොකඩවා පළකරයි.

මාසික සංචාරක පැමිණීමේ වාර්තාව, ත්‍රෛමාසික සංචාර අංශ වාර්තාව, වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සහ සංචාරක පැමිණීම, විදේශ විනිමය ඉපයීම, රැකියා අවස්ථා ඇති කිරීම, හෝටල් කාමර භාවිතය, සංචාරක රටා සහ හැසිරීම්, වඩාත් ආකර්ෂණීය ස්ථාන, භාවිතා කරන ලද සේවා සහ පහසුකම්, වියදම් ප්‍රමාණ, සංචාරක නවාතැන් ගැනීම් පිළිබඳ දත්ත, ගුවන් යානා ගමන්වාර සහ ගුවන් යානාවල ගමන් කළහැකි සංඛ්‍යාව ආදී විස්තර අඩංගු ශ්‍රී ලංකාවෙන් බැහැරව යන සංචාරකයන්ගෙන් ලබාගන්නා තොරතුරු ආශ්‍රිත වාර්තාව එම වාර්තාවන්ය.










### 1.4 ජාත්‍යන්තර අත්දැකීම් සහ ධාරිතා වර්ධනය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන් පස්වන එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධාන රැස්වීමට සහ එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය පැවැත්වූ පුහුණු වැඩසටහනට සහභාගි විය. ඒ සඳහා සහභාගී වූ සංඛ්‍යාව 10 කි.

## 2. සැලසුම් කිරීම සහ සංවර්ධනය

### 2.1 සංචාරක නිකේතන සංවර්ධනය

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව වැඩිවෙමින් පවතින අතර ඒ සඳහා අවශ්‍ය නවාතැන් පහසුකම් ගොඩනැගීමට ආයෝජකයන් ආකර්ෂණය කරගැනීමේ අවශ්‍යතාවයක් තිබේ. කාමර පහසුකම් වැඩිකිරීම සඳහා ආයෝජනයට සුදුසු ස්ථාන තිබිය යුතුය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ එක් කාර්ය භාරයක් වන්නේ මෙවැනි අවශ්‍යතා සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම සහ ඒ සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි කිරීමට පහසුකම් සැලසීමයි.

සමෝදානික සංචාරක නිකේතන සංකල්පය ලොව වඩාත් ජනප්‍රිය සංචාරක ප්‍රදේශවල ඉතාමත් ජනප්‍රියය. ඒ යටතේ පැහැදිලිව හඳුනා ගන්නා සහ සැලසුම් කරන ලද නැවතුම් ප්‍රදේශ, විවෘත විනෝද උද්‍යාන, විදුලිබලය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි සංචාරක ක්‍රියාමාර්ග, පැහැදිලිව හඳුනාගත් ප්‍රදේශ සහ සැලසුම් කළ සංචාරක නිෂ්පාදන සමග එක්කර වඩාත් තිරසාර අයුරින් කළමනාකරණය කෙරේ. සුවිශේෂ සංචාරකයන් ග්‍රහණය කල හැකි අයුරින් අදාළ ප්‍රදේශයේ ආවේණික ලක්ෂණ සහ හැකියාවන්ට ගැළපෙන ලෙස මේ නිකේතන ගොඩනැගීම සිදු කෙරේ.

එම සංකල්පයට අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් කල්පිටිය, කුච්චවේලි සහ දෙද්දූව ඒකාබද්ධ නිකේතන, තේමා තුනක් එනම්, ගොඩබිම නිවාඩු නිකේතන, වෙරළ නිවාඩු නිකේතන සහ ජලාශ ආශ්‍රිත නිවාඩු නිකේතන වශයෙන් සංවර්ධනය කර ඇත.

#### 2.1.1 කල්පිටිය සංචාරක නිකේතනය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2014 වර්ෂයේදී කල්පිටිය සමෝධානික සංචාරක නිකේතන සංකල්පය ඉදිරිපත් කළේය. සමෝධානික සංචාරක නිකේතන යනු දැනට කල්පිටිය සංචාරක කටයුතු ඒ ආකාරයෙන් ම පවත්වා ගනිමින් අවට ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට හැකිවන අයුරින් ඔවුන්ද හවුල් කරගනිමින් සංචාරක කටයුතු වටපිටාව පුළුල් කිරීමය. කල්පිටිය සංචාරක නිකේතනයේ වැදගත් විශේෂත්වය වන්නේ මුහුදට අමතරව දූපත් ගණනාවක්ම පිහිටීමය.

සංචාරක නිකේතන ප්‍රදේශය, ඕලන්ද බොක්ක, පෘතුග්‍රීසි බොක්ක සහ කරෙයිතිවු, ඉප්පන්ටිව්, පෙරියාරච්චි, ඉරමටිවු සහ සින්නෙරාරච්චිලි, ඔඩ්ඩකරෙල්ටිව්, බත්තලන්ගුන්ඩුව, පල්ලියවත්ත සහ වෙල්ලායි යන රමණීය දූපත් 09 න්ද යුක්තය. එය මුහුද ආශ්‍රිත දූපත් නිකේතනය වශයෙන් හැඳින්වේ. කල්පිටිය නිකේතන ප්‍රදේශය තල්මසුන් නැරඹීම සඳහා ඉමහත් ප්‍රසිද්ධියක් උසුලයි. තවද මෙය විල්පත්තු ජාතික අභය භූමියට සහ අනුරාධපුර ඓතිහාසික පුරාවිද්‍යා නටඹුන් සහිත ප්‍රදේශවලට සමීපය. මුළු ප්‍රදේශය අක්කර 5000 කින් පමණ යුක්ත වන අතර අඩු ආයෝජනයකින් වැඩි ලාභයක් ලැබිය හැකි ව්‍යාපෘතියකි.

පහත සඳහන් කටයුතු දැනටමත් සම්පූර්ණ කර ඇත.

- දූපත් 12 ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පැවරීම.
- සංචාරක සංවර්ධන මූලික සැලැස්ම 2012 දී සකස් කළ අතර වර්තමාන තත්ත්වයට අනුව වැඩිදියුණු කෙරේ.
- යෝජිත සංවර්ධන කටයුතු සහ ඒවායින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම

සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- උපායමාර්ගික පරිසර අධ්‍යයනය සිදුකර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන ඇත.
- පෞද්ගලික අංශයේ ආයෝජනයෙන් ක්‍රියාත්මක කෙරෙන හෝටල් ව්‍යාපෘති දෙකක් ඉදිකිරීමට සූදානමින් සිටී.

පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී, ඒ සඳහා උනන්දුව තිබෙන ආයෝජකයන් සැලකිලිමත් වන ප්‍රධාන කාරණයන් වන්නේ අදාළ ස්ථානවලට පහසුවෙන් ලඟාවීමට නොහැකිවීම සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොතිබීමයි. එවැනි තත්ත්වයන් යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මාර්ග සංවර්ධනය, පාලම් තැනීම, සංචාරක පොලිස් ස්ථාන පිහිටුවීම වැනි කටයුතු සඳහා අදාළ රාජ්‍ය ආයතන සහ ප්‍රාදේශීය අධිකාරිය සමඟ සම්බන්ධීකරණය සිදු කරයි. ඊට අමතරව නිවාඩු නිකේතන සහ සංවර්ධන මාර්ගෝපදේශ, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය සහ පොදු පහසුකම් වෙනුවෙන් සංකල්පිත සැලසුම ලබාගැනීමට, කල්පිටිය සංචාරක ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන කිරීම යන කටයුතු සිදු කරමින් සිටී.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයේදී පහත සඳහන් කටයුතු ඉටු කර ඇත.**

- කල්පිටිය සරුංගල් මඟින් ලිස්සායන්නන්ගේ සංගමයේ සහයෝගයෙන්, ලොවපුරා සරුංගල් මඟින් ලිස්සායෑමේ ක්‍රියාව සඳහා මහත් ප්‍රසිද්ධියක් දරණ කල්පිටිය වෙරළේදී සරුංගල් මඟින් ජලය මත ලිස්සා යෑමේ උත්සවයක් පැවැත්විය.
- සංචාරක ව්‍යාපෘති සඳහා තිබෙන විභවය සහ එවැනි ව්‍යාපෘති ආරම්භ කළහැකි දූපත් පිළිබඳ සොයා බැලීම සඳහා 2018 වර්ෂයේදී ආයෝජකයින් ගණනාවක්ම කල්පිටිය ප්‍රදේශයට පැමිණියේය.

### 2.1.2 කුච්චවේලී වෙරළබඩ සංචාරක නිකේතනය

ත්‍රිකුණාමලයේ නිලාවේලි වෙරළබඩ සංචාරක නිකේතනයට සමීප කුච්චවේලි සංචාරක නිකේතනය පිළිබඳ අදහස සංකල්පයක් වශයෙන් මුලින්ම ඉදිරිපත් වන්නේ 2010 වර්ෂයේදීය. වෙරළ ඔස්සේ උතුරට ගමන් කරන අතර තුරදී නැවතුම් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වීමට කුච්චවේලි ප්‍රදේශයට විශාල හැකියාවක් තිබේ. මෙම සංචාරක නිකේතනය කාමර 3,500 කින් යුක්ත වේ.

පහත සඳහන් කටයුතු දැනටමත් සම්පූර්ණ කර තිබේ.

- වෙරළට මුහුණලා ඉරක්කන්ඩි සහ සලපයාරු පාලම අතර පිහිටි අක්කර 510 ක ඉඩම් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතියට අයත්ය. මෙම ස්ථානයට මහා මාර්ග පහසුකම් තිබේ.
- මුළු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 386 ක් දැනටමත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ලබාදී ඇති අතර අක්කර 124 ක ප්‍රමාණයක් තවදුරටත් ලබාදීමට තිබේ.
- යෝජිත සංවර්ධන කටයුතු සහ ඒ මඟින් බලාපොරොත්තු වන ඵල ප්‍රයෝජන පිළිබඳ ප්‍රාදේශීය ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා මහජන සම්බන්ධතා කටයුතු ක්‍රියාත්මක කර තිබේ.
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය දැනට කුච්චවේලි ප්‍රධාන සංචාරක සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.
- පාරිසරික අධ්‍යයනය සම්පූර්ණ කර මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන ඇත.
- උගා එස්කේප්ස් මැනේජ්මන්ට් (පෞද්) ආයතනය පවත්වාගෙන යන ජන්ගල් බීච් රෙසෝට් හෝටලය දැනටත් විවෘතව පවතී.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයේදී පහත සඳහන් කටයුතු සිදුකර ඇත.**

හාවඩ් කණ්ඩායමට 2017 වර්ෂයේදී සකස් කරන ලද යෝජිත කුච්චවේලි ධීවර ගම්මාන සංවර්ධන කටයුතු පිළිබඳ වාර්තාව දකුණු කොරියාවේ සියෝල් නගරයේ පැවැති පුහුණු වැඩසටහනකදී ඉදිරිපත් කළ අතර එය ප්‍රථම ස්ථානය දිනා ගත්තේය. ඉන්පසුව කුච්චවේලි ධීවර ගම්මානය සහ අනිකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳ සොයාබැලීම සඳහා දකුණු කොරියාවේ උපදේශක කණ්ඩායමක් කුච්චවේලි සහ ඒ අවට කළපුව නිරීක්ෂණයට පැමිණියේය. මේ සඳහා දකුණු කොරියාවේ උනන්දුව පළකර ඇති අතර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා තිරසර සංචාරක කර්මාන්තය පිළිබඳ පුහුණු වැඩසටහනක් කොරියානු සංචාරක සංවිධානය මඟින් හිල්ටන් හෝටලයේදී සංවිධානය කළේය.

### 2.1.3 දෙද්දූව ජලාශ්‍රිත නිකේතනය

දෙද්දූව, බෙන්තොටට නැගෙනහිරින් පිහිටා තිබෙන අතර එයට ජලාශ, වගුරු බිම් ප්‍රදේශ සහ අතහැර දමන ලද කුඹුරු ඉඩම් අයත් වේ. ජෙෆ්රි බාවා මහතාට අයත් ලුනු ගංගා නිවස සහ අනිකුත් දේපල වලට මායිම්ව දෙද්දූව පිහිටා ඇත. මෙම නිකේතනය ලුනුගංගා සංකීර්ණයේ ආකෘතිය අනුගමනය කර තිබේ.

පහත සඳහන් කටයුතු දැනටමත් සම්පූර්ණකර ඇත.

- මෙම ව්‍යාපෘතියට අක්කර 1800 අයත් වන අතර දැනටමත් අක්කර 1732.03 ක ප්‍රදේශයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරා ඇත.
- යෝජිත සංවර්ධන කටයුතු සහ ප්‍රතිලාභ පිළිබඳ අවට ප්‍රජාව දැනුම්වත්කිරීම සඳහා ප්‍රජා සම්බන්ධතා කටයුතු සිදුකර ඇත.
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,දක්ෂිණ සංවර්ධන මණ්ඩලය සමඟ සංකල්පිත සැලැස්ම පිළියෙළ කර ඇත.

### 2.1.4 සංචාරක නිකේතන සඳහා හඳුනාගෙන ඇති නව ස්ථාන

පහත සඳහන් ප්‍රදේශ සංචාරක සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරී පාලන මණ්ඩලය ඉඩම් අත්පත් කර ගැනීම සහ පැවරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

වගුව 2.1 නව සංචාරක නිකේතන සහ ඒ සඳහා ඇස්තමේන්තු ගත ඉඩම් ප්‍රමාණය

| ස්ථානය | තක්සේරු කරඇති ඉඩම් ප්‍රමාණය - අක්කර |
|---|---|
| අකුරල | 493 |
| බොගවන්තලාව | 316 |
| වාලච්චේනිය | 265 |
| දෙනියාය | 350 |
| කොහිල වගුර | 28 |
| මුල්ලේරියාව - වැලිවිට (මාලබේ අධිවේගී මාර්ගය පිටවීම) | 36 |

## 2.2 පවතින සංචාරක නිකේතන අලුත්වැඩියා කිරීම සහ තත්ත්වයෙන් උසස් කිරීම.

### 2.2.1 යාල වනජීවී සංචාරක නිකේතනය

වනජීවීන් පිළිබඳ ඇල්මක් දක්වන අයට ඒ පිළිබඳ සමීප අත්දැකීම් ලබාදීමට මෙම සංකල්පය ඉදිරිපත් විය. යාල ජාතික වන උද්‍යානයේ ආරක්ෂිත කලාපයට කිලෝ මීටරයක් පිටතින් මෙම සංචාරක නිකේතනය පිහිටුවා තිබේ.

- යාල වනජීවී සංචාරක නිකේතනයේ (YWR) සැලකිය යුතු සංවර්ධන ප්‍රගතියක් තිබේ. නිකේතනයේ උතුරු ප්‍රදේශය දක්වා සවිකරන ලද වැඩි වෝල්ටීයතා විදුලි සම්බන්ධතා සමග නිකේතනයේ උතුරු කරය දක්වා වූ පොදු ලගා වීමේ මාවත සම්පූර්ණ කර ඇත.
- උගා එස්කෙප් මැනේජ්මන්ට් (පුද්) සමාගම පවත්වාගෙන යන චේන හට් සහ වයිල්ඩ් කෝස්ට් ලොජ් (පුද්) සමාගම පවත්වාගෙන යන වයිල්ඩ් කෝස්ට් ටේන්ටඩ් ලොජ්, වාණිජ කටයුතු ඇරඹීය.
- තවත් හෝටල් ව්‍යාපෘති තුනක් ගොඩනගමින් තිබේ.
- අදාළ එකඟ වූ කොන්ත්‍රාත්තුවට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එක් ව්‍යාපෘතියකට අදාළ බදු ගිවිසුම අත්හිටුවීමට කටයුතු යොදා ඇත.
- පාර්ශවකරුවන්ගේ අනුමැතිය ලබාගැනීම සඳහා ප්‍රධාන සැලැස්ම සම්පූර්ණ කර අදාළ වාර්තාව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සහ පාර්ශවකරුවන්ට ඉදිරිපත් කළේය. එහිදී ලැබෙන අදහස් සහ යෝජනා සමග අවසන් ප්‍රධාන සැලැස්ම ඉදිරිපත් කළ යුතුය. සියලුම පොදු පහසුකම් සංවර්ධනය, යටිතල පහසුකම් සහ අගය එකතු කිරීමේ කටයුතු, උක්ත සඳහන් ප්‍රධාන සැලැස්මේ නිර්දේශවලට අනුකූලව ඉදිරියේදී සිදුකෙරේ.

## 2.3 නිවෙස් ලැගුම් වැඩසටහන

අව්‍යාජ ශ්‍රී ලංකා අත්දැකීම් ලබා ගත හැකි සහ සංචාරක කාමර සංඛ්‍යාව වැඩි කිරීමට හැකි වන නිවෙස් ලැගුම් වැඩසටහන දියුණු කිරීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ එක් ක්‍රියා මාර්ගයකි. මෙමගින් ප්‍රාදේශීය ජනතාව සමග සංචාරකයන්ට එකට සිටීමට ඉඩ ලැබෙන අතර සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ ප්‍රාදේශීය මට්ටම දක්වා පැතිරීමටද අවස්ථා ව සැලසේ.

### නිවෙස් ලැගුම් ගම්මාන

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිවෙස් ලැගුම් ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කළ අතර දැනට අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කර ඇත.

නිවෙස් ලැගුම් වැඩසටහන ක්‍රියාත්මක කරන අය සඳහා දිගුකාලීන පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කර තිබේ. පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සුදුසු පෞද්ගලික ආයතන හෝ සමාගම් හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කටයුතු ආරම්භ කර ඇත.

### නිවෙස් ලැගුම් වැඩිදියුණු කිරීම සඳහා එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය පහසුකම සැපයීම.

2018 අයවැය යෝජනාවකි. අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඉල්ලුම්පත්‍ර 716 ක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිවෙස් ලැගුම් ඒකක 264 ක් සඳහා ණය පහසුකම් ලබා දීමට අදාළ නිර්දේශ බැංකුවලට නිකුත් කර ඇත. සමහර ඉල්ලුම්කරුවන් අදාළ ණය පහසුකම් ලබාගැනීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණයේ ණය යෝජනාක්‍රමය වෙත යොමු කර ඇත.

ඔවුන් දෙදෙනෙකු නිවාස නවාතැන් ගම්මාන පිහිටුවීමට සැලසුම් කර ඇති අතර විස්තර පහත දැක්වේ



## 2.4 සංචාරක ලාංඡන වැඩසටහන

සංචාරක ස්ථානවල සංචාරකයන්ගේ කටයුතු පහසු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ගෝලීය සංචාරක සංවිධානය (UNWTO) ඒ ඒ ස්ථානවලට ලාංඡන සපයයි. ඒ අනුව රටපුරා පවතින වඩාත් ජනප්‍රිය සංචාරක කේන්ද්‍රස්ථාන වල එක්සත් ජාතීන්ගේ ගෝලීය සංචාරක සංවිධානය මගින් අනුමත කරන ලද ලාංඡන සවිකිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කර තිබේ. 2017 - 2020 දක්වා වන සංචාරක උපාය මාර්ගික වැඩසටහනට අනුකූලව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මෙම වැඩසටහන සඳහා මූල්‍යධාර සපයන අතර පළාත් සංචාරක අමාත්‍යාංශ මෙය ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ඇත. පළාත් නවය තුළම මේ සඳහා වඩාත් යෝග්‍ය කේන්ද්‍රස්ථාන දැනටමත් තෝරාගෙන ඇති අතර ලාංඡනවල තිබිය යුතු ගුණාත්මකභාවය සහ සමානත්වය පවත්වාගැනීම සඳහා අවශ්‍ය වන විශේෂ ප්‍රමිති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සපයයි. 2018 වර්ෂය අවසානය වන විට මෙම ලාංඡන පුවරු 15 ක් මධ්‍යම පළාත තුළ සවිකර ඇත. අදාළ අනුමැතිය ලැබුණු වහාම අනෙකුත් පළාත් සහා ද මෙම ලාංඡන පුවරු සවිකිරීමට සූදානමින් සිටී.

**වගුව 2.4 පළාත් අනුව ලාංඡන සවිකිරීමේ වැඩසටහනෙහි විස්තර.**

| පළාත | ලාංඡන පුවරු සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|
| උතුරු පළාත | 25 | ලාංඡන පුවරු 18 ක් සවිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලැබී ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් තිබේ. |
| මධ්‍යම පළාත | 18 | ලාංඡන පුවරු 15 ක් සවිකර ඇති අතර ඉතිරි පුවරු සවිකිරීමට කටයුතු කරමින් තිබේ. |
| උතුරු මැද පළාත | 43 | ප්‍රසම්පාදන ක්‍රියවලිය සිදුකරමින් තිබේ. |
| දකුණු පළාත | 26 | අදාළ ආයතන වල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. |
| නැගෙනහිර පළාත | 06 | අදාළ ආයතන වල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. |
| වයඹ පළාත | 47 | අදාළ ආයතන වල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. |
| බස්නාහිර පළාත | 91 | අදාළ ආයතන වල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. |
| සබරගමුව පළාත | තීරණය කිරීමට ඇත. | පරීක්ෂා කිරීම් අවසාන කර ඇති අතර විස්තර විශ්ලේෂණය කරමින් සිටී. |
| ඌව පළාත | 46 | අදාළ ආයතන වල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. |

## 2.5 වැඩි ප්‍රසිද්ධියක් නොමැති සංචාරක ආකර්ෂණ ව්‍යාපෘති

පුළුල් විවිධත්වයක් සහිත නව සංචාරක විභවයක් සහිත ස්ථාන සහ විවිධාංග, දිවයිනට පැමිණෙන සංචාරකයන්ට හඳුන්වාදීම මෙම කටයුතුවල පරමාර්ථය වේ.

ඒ ඒ පළාත්වල වැඩි ප්‍රසිද්ධියක් නොමැති සංචාරක ආකර්ෂණ විභවයන් සහිත කටයුතු පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ තොරතුරු පද්ධතියට ඇතුල් කිරීම සඳහා එහි ධාරිතාව වැඩි කිරීම සහ මධ්‍යම පද්ධතියේ අඩංගු තොරතුරු පළාත් සභා සමඟ හවුලේ භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්විය. මෙම පුහුණු වැඩසටහන සඳහා පළාත් නවයම නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී විය.

# 3. සංචාරක අංශයේ ආයෝජන

## 3.1 ආයෝජක සම්බන්ධතා ඒකකය (IRU)

සංචාරක කර්මාන්තයේ දේශීය හා විදේශීය ආයෝජකයන් සඳහා මධ්‍යම පහසුකම් සැලසීමේ සේවාවක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2010 වර්ෂයේදී ආයෝජක සම්බන්ධතා ඒකකය පිහිටුවිය. ආයෝජක සම්බන්ධතා ඒකකයේ කාර්ය භාරය වන්නේ, ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික සංචාරක ව්‍යාපෘති සංවර්ධනයට අවශ්‍යය පහසුකම් සැලසීමට අදාළ තොරතුරු ලබාදීම, අදාළ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, ආයතන සහ පාර්ශවකරුවන්ගෙන් විවිධ අනුමැතීන් ලබාගැනීමට හැකිවන අයුරින් ඒ ඒ සංචාරක කටයුතුවල තිබිය යුතු ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීමට අවශ්‍ය මගපෙන්වීම ලබාදීමය. ආයෝජක සම්බන්ධතා ඒකකය පිහිටුවීමේ අවසාන අරමුණ වන්නේ පහත සඳහන් කටයුතු වෙනුවෙන් ආයෝජකයන්ට පහසු කිරීම සහ ඔවුනට ඇතිවන අපහසුතා අවම කිරීමයි.

- සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජකයින්ට අවශ්‍ය සහයෝගය සහ තොරතුරු ලබාගැනීම සඳහා එකම සම්බන්ධතා ස්ථානයක් ඇති කිරීම.
- සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජක ව්‍යාපෘති කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම.
- ශ්‍රී ලංකාව තුළ සංචාරක ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය අවම කිරීම.

අන්තර්ජාතික සංවර්ධනය උදෙසා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීමට සහය ලබාදීමේ ව්‍යාපෘතිය (SAIL), ආයෝජක සම්බන්ධතා ඒකකයේ (IRU) ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමට සහය ලබාදීමට 2016 වර්ෂයේදී ඉදිරිපත්විය. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව තුළ ආයෝජන කඩිනම් කිරීමට සහය දීමේ ව්‍යාපෘතිය වශයෙන් නම්කර තිබේ (SAIL). උක්ත සඳහන් මූලපිරීම් 2018 වර්ෂය තුළත් ක්‍රියාත්මකවූ අතර නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමැතිය ලබාදීමේ ක්‍රියාදාමය සම්පූර්ණ කළ අතර පාර්ශව සියල්ලම සමඟ සාකච්ඡා කිරීමෙන් පසු

දෙපාර්ශවයම අනුමැතියට අවශ්‍ය ලිපිලේඛන සංඛ්‍යාව අඩුකිරීමෙන් සහ ඒ ඒ අනුමැතිය සඳහා ස්ථිර කාල රාමුවක් හඳුන්වා දීමෙන් අදාළ ක්‍රමවේදය වඩාත් සරල කිරීමට එකඟවිය. ඊට සමගාමීව 2018 අගෝස්තු 15 වන දින ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එකඟතා ගිවිසුමට අත්සන් තබන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් එහි සභාපති කාවන් රත්නායක මහතා ද නාගරික සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් එහි සභාපති ආචාර්ය ජගත් මුනසිංහ මහතා ද මෙලෙස ගිවිසුමට අත්සන් තබන ලදී.





සංචාරක ව්‍යාපෘති සඳහා පාරිසරික අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන මධ්‍යම පාරිසරික අධිකාරියේ දැනට පවතින අනුමත කිරීමේ ක්‍රියාවලිය අනුරූපනය සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීමට සහය වීමේ ව්‍යාපෘතිය (SAIL) සහයෝගය ලබාදුනි.

සංචාරක ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාගැනීමේදී ඒ සඳහා ගතවන කාලය අවම කර ගැනීම සහ නැවත නැවත ඉදිරිපත් කිරීම මග හැරවීමෙන් අනවශ්‍ය ලේඛන සංඛ්‍යාව අඩුකර ගැනීම සඳහා පොදු ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, ආයෝජක මණ්ඩලය සහ කොළඹ මහ නගර සභාව සමඟ සාකච්ඡා ආරම්භකරන ලදී.

තවද ආයෝජක සම්බන්ධතා ඒකකයේ (IRU) අනුමැතිය ලබා ගැනීමේදී භාවිතා කළයුතු අලුතින් හඳුන්වා දෙන ලද දියුණු කරන ලද මෘදුකාංග භාවිතය පිළිබඳව අදාළ අනුබද්ධිත ආයතනවල නියෝජිතයන් දැනුම්වත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීමට සහය ලබාදීමේ ව්‍යාපෘතිය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. ආයෝජක සම්බන්ධතා ඒකකයේ වර්තමාන තෝරාගැනීමේ වැඩපිළිවෙල පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා අදාළ ආයතන 11 ක ජ්‍යේෂ්ඨ නිළධාරින්ගේ සහභාගිත්වයෙන් අන්තර් ආයතනික රැස්වීමක් සංවිධානය කරන ලදී.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, සිවිල් ගුවන් සේවා අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කොළඹ මහනගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් සහභාගි වූ සම්බන්ධීකරණ නිලධාරින් සඳහා පුහුණු සැසිවාරයක් 2018 ඔක්තෝබර් 29වනි දින පවත්වන ලදී.







### 3.2 ආයොජක සම්බන්ධතා ඒකකයේ ප්‍රගතිය

2018 වර්ෂයේදී මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 919.04 වටිනාකමකින් යුත් සංචාරක ව්‍යාපෘති 141 සඳහා වූ ඉල්ලුම් පත්‍ර පිළිබඳ කටයුතු කර ඇත. එම ව්‍යාපෘති 141 න් ව්‍යාපෘති 20 ක් සඳහා අවසන් අනුමැතිය ලබා දී ඇති අතර අදාළ තොරතුරු පහත සඳහන් වේ.

වගුව 3.1 සංචාරක අංශයේ ආයෝජනය

| | විස්තර | ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | ආයෝජනය ඇ.ඩො මිලයන | ආයෝජනය රු. මිලයන |
|---|---|---|---|---|---|
| අ | ඉදිරිපත් වූ ඉල්ලුම් පත්‍ර | 141 | 4,051 | 919.0 | 168,184 |
| ආ | මූලික අනුමැතිය ලැබූ ව්‍යාපෘති | 107 | 3,896 | 913.3 | 162,140 |
| ඇ | අවසාන අනුමැතිය ලැබූ ව්‍යාපෘති | 20 | 292 | 17.2 | 3,142 |









වගුව 3.1 ප්‍රදේශය අනුව ලැබුණු ව්‍යාපෘතිවල ව්‍යාප්තිය




වගුව 3.2 ප්‍රදේශය අනුව අවසාන අනුමැතිය ලැබුණු ව්‍යාපෘතිවල ව්‍යාප්තිය - 2018

2018 දෙසැම්බර් 31 දිනට ලබාදුන් අවසාන අනුමැති වලට අදළව ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග



වගුව 3.2 අවසාන අනුමැතිය ලැබූ ව්‍යාපෘතිවල දිස්ත්‍රික් මට්ටමින් වර්ගීකරණය.

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | නියෝජනය |
|---|---|---|---|
| අම්පාර | 7 | 95 | 0.51 |
| අනුරාධපුරය | 4 | 111 | 0.59 |
| මඩකලපුව | 16 | 439 | 2.34 |
| බදුල්ල | 10 | 300 | 1.60 |
| කොළඹ | 44 | 5357 | 28.56 |
| ගාල්ල | 61 | 3177 | 16.93 |
| ගම්පහ | 23 | 1245 | 6.64 |
| හම්බන්තොට | 31 | 1610 | 8.58 |
| යාපනය | 10 | 315 | 1.68 |
| කළුතර | 26 | 1650 | 8.80 |
| මහනුවර | 16 | 559 | 2.98 |
| කෑගල්ල | 2 | 60 | 0.32 |
| කුරුණෑගල | 1 | 16 | 0.09 |
| මාතලේ | 19 | 677 | 3.61 |
| මාතර | 25 | 897 | 4.78 |
| නුවරඑළිය | 9 | 714 | 3.81 |
| පුත්තලම | 15 | 685 | 3.65 |
| ත්‍රිකුණාමලය | 21 | 590 | 3.14 |
| මොණරාගල | 2 | 42 | 0.22 |
| මන්නාරම | 1 | 52 | 0.28 |
| පොළොන්නරුව | 2 | 54 | 0.29 |
| රත්නපුර | 3 | 66 | 0.35 |
| වවුනියාව | 2 | 49 | 0.26 |
| | 350 | 18,760 | 100.00 |




# 4. ප්‍රමිතිය සහ තත්ත්ව සහතිකකරණය

## 4.1 සංචාරක ආයතන ලියාපදිංචිය

ප්‍රමිති සහ තත්ව සහතිකකරණ අංශයේ ප්‍රධාන සහ වැදගත්ම කාර්යභාරය වන්නේ සංචාරක ආයතන සේවා සපයන්නන් ලියාපදිංචිය සහ බලපත් ලබා දීමය. මෙම කාර්ය සඳහා නොකඩවා පරීක්ෂණ සිදු කෙරේ. හෝටල් අමුත්තන්ගේ නිවාස සහ ආපනශාලා සඳහා මත්පැන් බලපත්‍ර ලබාදීම වෙනුවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සංචාරක ආයතනවල නේවාසික කාර්යමණ්ඩල වලට ශ්‍රී ලංකාවේ රැකියාවල නිරතවීමට වීසා ලබාදීම සඳහා ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කටයුතු කරයි. ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සංචාරක ආයතන සංඛ්‍යාව පහත සඳහන්වේ.

**වගුව 4.1 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2018 අවසාන වන විට ලියාපදිංචිය සහ බලපත් ලබාදී ඇති නවාතැන් ඒකක සහ නවාතැන් පහසුකම්**

| ප්‍රභේදය | 2018 ජන. සිට දෙසැ. 31 | | 2018 දක්වා | |
|---|---|---|---|---|
| | ඒකක | කාමර | ඒකක | කාමර |
| තරු 5 හෝටල් | 2 | 733 | 23 | 5,150 |
| තරු 4 හෝටල් | 4 | 410 | 20 | 2,169 |
| තරු 3 හෝටල් | - | - | 23 | 2,364 |
| තරු 2 හෝටල් | 2 | 70 | 33 | 1,612 |
| තරු 1 හෝටල් | - | - | 35 | 1,648 |
| වර්ගීකරණය කරන ලද හෝටල් වල එකතුව | 08 | 1,213 | 134 | 12,943 |
| වර්ගීකරණය නොකරන ලද සංචාරක හෝටල් | 17 | 899 | 233 | 9,737 |
| බුටික් හෝටල් | 5 | 120 | 30 | 618 |
| බුටික් විලා | 3 | 27 | 36 | 239 |
| අමුත්තන්ගේ නිවාස | 46 | 590 | 782 | 8,629 |
| තන්වාසිකව සිටීමේ ඒකක | 81 | 255 | 445 | 1,352 |
| බංගලා | 52 | 190 | 390 | 1,613 |
| ප්‍රවේණික බංගලා | - | - | 4 | 19 |
| ප්‍රවේණික නිවාස | 1 | 1 | 3 | 9 |
| කුලියට දුන් නිවෙස් ඒකක | 8 | 46 | 68 | 219 |
| කුලියට දුන් නිවාස | - | - | 6 | 19 |
| එකතුව | 221 | 3,341 | 2,121 | 35,397 |

## 4.2 සංචාරක හෝටල් වර්ගීකරණය

සංචාරක හෝටල් වර්ගීකරණයට අදාළව නිකුත් කර ඇති අංක 1693/20 දරන 2016 අප්‍රේල් 20 දිනැති

අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව සියලුම සංචාරක හෝටල් වර්ගීකරණය කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි. 2016 මැයි 01 දින සිට අවුරුදු දෙකක කාලයක් දක්වා බලපැවැත්වෙන පරිදි හෝටල් වර්ගීකරණ කමිටුව පත්කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2017/18 කාල පරිච්ඡේදය අතර සංචාරක හෝටල් 27 ක් වර්ගීකරණය කර ඇති අතර ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ සංචාරක කර්මාන්ත සහ ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතා අදාළ සමරු ඵලක පිරිනැමීම කරන ලදී.









